කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

සිංහල භාෂාව හා සාහිත්‍ය

6 ශ්‍රේණිය ................................ කාලය පැය 1 1/2 යි

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. සිංහල වර්ණ මාලාවේ ස්වර ගණන කීය ද ?
02. සිංහල වර්ණ මාලාවේ ව්‍යංජනාක්ෂර ගණන කීය ද?
03. මහාප්‍රාණ අක්ෂර මුලට යොදා වචන 2 ක් ලියන්න.
04. සඤ්ඤක අක්ෂර දෙකක් භාවිතාකර ඔබ කැමති වචන 2 ක් ලියන්න
05. ගයනුකිත්ත සහිත වචනයක් ලියන්න.
06. මම , අපි, ඔවුන් යන පද කුමන නාම පද වර්ගයට අයත් ද ?
07. අඹ යන පදයට සමාන අර්ථ දෙකක් දෙන්න.
08. දුව දුවා, අඬ අඬා යන පද කුමන ක්‍රියා වර්ගයට අයත් ද ?
09. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන තෝරන්න.
ප්‍රදර්ෂන, ප්‍රදර්ශනය, ප්‍රකාශණ, ප්‍රකාශණ
10. මෙහි ඉරිගසා ඇති අකුරුවලට කියන නම් ලියන්න.
වර්ෂ ය, දේශන , සමනලයා
11. විරුද්ධ පදය ලියන්න.
නිශා -
සංකීර්ණ -
12. සමාන පද ලියන්න.
පොළොව -
අඹර -

- මෙම වාක්‍යවල හිස්තැන් පුරවන්න.

13. පියුම්හු විකසිත ..........................................
14. ඔබ අද පාසලට ..........................................
15. ගස් වැල් සුළඟට ..........................................
16. තාපසයා භාවනා ..........................................
17. උපාසිකාව පහන ..........................................

- උක්ත අනුක්ත පද ලියන්න.

18. .................................... මිනිසෙකු.
19. ගැහැනියක් ....................................
20. .................................... මා

(ලකුණු 20 x 2 = 40)

## 2 - කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01) " හා , හා , මම එහෙමත් කරනවද ?"

i. මේ ප්‍රකාශය ඇතුළත් පාඩම කුමක් ද ?

ii. මෙම පාඩම උපුටාගත් පොත කුමක් ද ?

02) පිපී ගියාවූ ගන මුකලන් කැලේ
මලේ කොළේ පාට මෙසේ මෙසේ වෙති
.................................................................
.................................................................

i. ඉහත කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

ii. මෙම කවි පංතිය රචනා කළේ කවුද ?

03) "අපට කුකුරුමුවන් ගෙඩි ටිකක් කඩා ගන්ට ඇත්නම්"

i. ඉහත ප්‍රකාශය කළේ කවුද ?

ii. ඉහත ප්‍රකාශය කුමන පාඩමෙන් උපුටා ගන්නා ලද්දක්ද ?

04) "එක කාරණේකට නෙ මෙයි, දහකාරණේකට උණත් මම එකඟ වෙන්නම්,"

i. ඉහත සඳහන් "එකඟකරගත් කාරණය කුමක්ද ?"

ii. මෙම අවස්ථාවට සහභාගී වූ තිදෙනා කවුද ?

05)

i. සුබ පැතුම් පත් යවන අවස්ථා 03 ක් ලියන්න.

ii. සුබ පැතුම්පතක් සෑදීමේදී සැලකිය යුතු කරුණු 03 ලියන්න.

06) රාත්‍රි අහස, වැස්ස, මුහුද , පරිසරය, අම්මා යන මාතෘකාවලින් එකක් තෝරා ගෙන කවි 2 ක් නිර්මාණය කරන්න එයට උචිත චිත්‍රයක් අඳින්න. (ලකුණු 10)

07) පහත සඳහන් කවි පංතිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

වට සේ පුන්සඳ මෙන් බබළාවී
අතේ වළලු මෙන් සබ නෑදේවී
ඇසේ අඳුන් ගා සිනහ කරාවී
අතේ කළය ගෙන නැටුමට ඒවී

කළගෙඩි පිඹිනා බාල ළමුන්නේ
බල සොඳ රුසිරු රන් ලිය වැන්නේ
නළල ද දිළිසෙන අඩ සඳ වැන්නේ
බලන්න සොඳුරුව පියබඳ වන්නේ

i. ඉහත ජනගීය උපයෝගී කරගත්තේ කුමන නැටුම් සඳහා ද ?

ii. මෙහි එන බාල ළමුන් ඇස් අලංකාර කරගන්නේ කෙසේ ද ?

iii. මෙහි නළල උපමාකර ඇත්තේ කුමකට ද ?

iv. සඳ, ඇස යන පදවලට සමාන පද එක බැගින් ලියන්න.

v. මොවුන් නැටුමට එන විට රැගෙන එන්නේ මොනවා ද ? (ලකුණු 10)